**වැලිමඩ ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**
---------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

----------------

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

---------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර,එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූලි 24 වන දින සභාපතිවරයාට යවා ඇත.

1.2 **තත්ත්වාගණනය කළ මතය**

--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට වැලිමඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

-----------------------------------------

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

-----------------------

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේ දී නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයේදී මිලදීගත් යූ.පී.එස්.උපකරණයේ වටිනාකම රු.13,500 ක් වුවත්, එය රු.135,000 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා අදාල වත්කම් ගිණුම හා ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීමේ ගිණුම රු.121,500 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ මිලදීගත් අත්කරත්ත 04 ක වටිනාකම රු.99,200 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ අවසන් ලිපි ද්‍රව්‍ය තොගය වූ රු.31,458 ක් ගිණුම්ගත නොවීමෙන් එම වටිනාකමෙන් ජංගම වත්කම් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ සේවක ණය වටිනාකම රු.9,905 ක් වැඩියෙන් ගිණුම්ගත කිරීමෙන් එම වටිනාකමෙන් වත්කම් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ සේවක ණය පොළී ආදායම රු.375,854 ක් වුවත්, එය රු.425,299 ක් ලෙස ගිණුම්ගත වීමෙන් ආදායම් රු.49,445 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය තුළ මිලදීගත් පුස්තකාල පොත් වල වටිනාකම රු.58,685ක් අඩුවෙන් ගිණුම්ගත වීම හේතුවෙන් වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) ඉඩම් හා ගොඩනැගිලි රු.17,817,634 ක් ගිණුම්ගත නොවීම හේතුවෙන් එම වටිනාකමෙන් වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීමේ ගිණුම අඩුවෙන් දක්වා තිබුණි.

(ඍ) සමාලෝචිත වර්ෂයේ උසාවි දඩ ආදායම රු.5,000,000 ක් වුවත්, එය රු.10,798,781ක් ලෙස ගිණුම්ගත වීමෙන් ආදායම් රු.5,798,781 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂය අවසානයට හිඟහිටි මුද්දර ගාස්තු ආදායම් රු.7,981,245 ක් වුවත්, එය රු.10,798,652ක් ලෙස ගිණුම්ගත වීමෙන් ජංගම වත්කම් රු.2,817,407 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂයේ ආරම්භයේ කලින් ගෙවීම් ලෙස සටහන්ව තිබූ රු.422,530 ක වටිනාකම සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.339,760 ක් ලෙස ගිණුම්ගත කිරීමෙන් ජංගම වත්කම් රු.82,770 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයේ නොපියවූ ගබඩා අත්තිකාරම් රු.509,658 ක් වැඩියෙන් ගිණුම්ගත වීම හේතුවෙන් එම වටිනාකමින් ජංගම වත්කම් වැඩියෙන් දක්වා තිබුණි.

1.3.2 **නොසැසඳුනු ගිණුම්**

------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුදල් ශේෂය මුදල් පොත අනුව රු.3,789,502 ක් වූ නමුත්, බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව මුදල් ශේෂය රු.3,822,502 ක් වීමෙන් රු.33,000ක වෙනසක් පැවතුණි.

1.3.3 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-----------------------------------

(අ) **ලැබිය යුතු ගිණුම්**

-------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු.45,301,475 ක් වූ අතර හිඟහිටි වරිපනම් රු.2,923,478 ක් හා හිඟහිටි වෙනත් අදායම් රු.42,377,997 ක් එහි ඇතුළත් විය.

(ආ) **ගෙවිය යුතු ගිණුම්**

---------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබූ ණයහිමියෝ රු.30,300,544 ක් විය.

1.3.4 **විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

--------------------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරිම නිසා එකතුව රු.39,141,269 ක් වූ ගිණුම් විෂයයන් 04 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.5 **අනුකූල නොවීම්**

1.3.5.1 **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවු අවස්ථා පහත දැක්වේ.

| | | නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම |
|---|---|---|---|---|
| (අ) | (i) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152 වගන්තිය | 36,000 | වෙළඳ බලපත්‍ර ගාස්තු අය කර ගත යුතු ආයතන 09 කින් වෙළඳ බලපත්‍ර ගාස්තු අය කරගෙන නොතිබුණි. |
| | (ii) | 1988 අංක 56 හා 2000 අංක 53 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ අංක 1523/16 දරන වර්ෂ 2008 ක් වු ජනවාරි 26 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය | | (i) 2017 වර්ෂය සඳහා පාරිසරික බලපත්‍ර ලබාගත යුතු ආයතන සම්බන්ධව වාර්ෂිකව සමීක්ෂණයක් සිදු කර නොතිබුණි.<br>(ii) මස් පිණිස සතුන් මරණ ස්ථාන සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගැනීම අනිවාර්ය වුවත්, ගෝඝාතකාගාර 02 ක් සඳහා 2017 වර්ෂයට අදාළව පරිසර බලපත්‍ර ලබාගෙන නොතිබුණි. |
| (ආ) | | 1988 ප්‍රාදේශීය සභා(මූල්‍ය හා පරිපාලන)රීති | | |
| | (i) | 156 රීතිය | | ප්‍රාදේශීය සභා 11 ආකෘතිය ප්‍රකාරව ගෙවීම් මුදල් පොත පිළියෙල කර නොතිබුණි. |
| | (ii) | 218 රීතිය | | වර්ෂයකට වරක් සභාව සතු ඉඩම් හා ගොඩනැඟිලි සමීක්ෂණයක් සිදුකර වත්කම් වාර්තා යාවත්කාලීන කර නොතිබුණි. |
| (ඇ) | | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | |
| | | xxiv වන පරිච්ඡේදයේ 4 වගන්තිය | 180,351 | සභාවේ සේවයේ නියුතුව සිට ස්ථාන මාරුවීම් ලැබූ හා සේවය හැර ගොස් ඇති සේවකයින් දෙදෙනෙකුගෙන් අයවිය යුතු සේවක ණය අය කරගෙන නොතිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | |
| (i) | මුදල් රෙගුලාසි 371 | 1,443,191 | 2000 වර්ෂයට පෙර සිට අවස්ථා 32 කදී විවිධ පාර්ශවයන් වෙත ගෙවන ලද අත්තිකාරම් 2017 දෙසැම්බර් 31 දින වන විටද පියවා නොතිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 571 | 2,377,945 | අවස්ථා 144 කදී තැන්පත් කර 2017 දෙසැම්බර් 31 වන විට වසර 02 ක කාලයක් ඉක්මවූ තැන්පත් නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඉ) | 2016 දෙසැම්බර් 26 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | | සභාව සතු රථවාහන සම්බන්ධයෙන් ඉන්ධන දහන පිළිබඳ පරීක්ෂාවක් සිදුකළ යුතු වුවත්, එක් ට්‍රැක්ටරයක හැරුණු විට සභාවට අයත් වෙනත් රථවාහන සම්බන්ධයෙන් ඉන්ධන දහන පරීක්ෂාවක් සිදු කොට නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.35,483,499 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.24,918,028 විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 ඇස්තමේන්තුගත ආදායම | 2017 බිල්කළ ආදායම | 2017 රැස්කළ ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2016 ඇස්තමේන්තුගත ආදායම | 2016 බිල්කළ ආදායම | 2016 රැස්කළ ආදායම | 2016 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i)වරිපනම් හා බදු | 5,284,730 | 1,795,461 | 4,107,925 | 1,278,448 | 4,733,940 | 3,483,937 | 2,496,555 | 987.382 |
| (ii) කුලී | 3,282,860 | 2,866,027 | 4,107,925 | (16,539) | 2,562,240 | 2,897,749 | 2,698,608 | 199,142 |
| (iii) බලපත්‍ර ගාස්තු | 2,522,600 | 2,162,850 | 2,492,780 | (329,930) | 2,279,600 | 2,275,711 | 2,362,007 | (86,085) |
| (iv)වෙනත් ආදායම් | 12,410,110 | 11,985,566 | 11,750,900 | 218,131 | 12,891,870 | 10,037,838 | 9,837,901 | 199,937 |
| එකතුව | 23,500,300 | 18,809,964 | 22,459,530 | 1,150,114 | 22,467,650 | 18,695,236 | 26,252,405 | 1,300,376 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

2017 දෙසැම්බර් 31 දිනට මුළු බිල්කල ආදායම රුපියල් මිලියන 18.8 ක් වූ අතර, වර්ෂය තුල රැස්කල ආදායම රුපියල් මිලියන 22.4 ක් විය. වර්ෂය අවසන් වන විට රුපියල් මිලියන 1.15 ක ආදායමක් අයකර ගැනීමට තිබුණු අතර, පෙර වර්ෂය සමඟ සැසඳීමේදී හිඟ ආදායම් සියයට 11.5 කින් අඩුවී තිබුණි.

### 2.2.3 කුලී

2011 වර්ෂයට අදාල ටෙන්ඩර් කඩ කුලී රු.1,293,950 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් ආයතන වලින් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබුණු උසාවි දඩ රු.10,798,652 ක් සහ මුද්දර ගාස්තු රු.8,400,000 ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය,පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම,ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

#### (අ) ක්‍රියාකාරී සැලැස්ම

2017 වර්ෂයට ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි.

(ආ) **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

---------------------------------

අවිධිමත් ලෙස කසළ බැහැර කිරීමේ හා පිලිස්සීමේ ස්ථානයක් තැන්නේකුඹුර උප කාර්යාල භූමියේ පවත්වාගෙන ගොස් තිබුණි.

(ඇ) **තිරසර සංවර්ධන ඉලක්ක**

---------------------------

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගු කාලීන සැලසුම් 2017 දෙසැම්බර් 31 දින තෙක් සකස් කර නොතිබුණි.

3.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------

(අ) ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය යටතේ පවත්නා ග්‍රාමීය කාන්තා අභිවෘද්ධි මධ්‍යස්ථානයක් තැන්නේකුඹුර උප කාර්යාල ගොඩනැගිල්ලේ අවුරුදු 10ක සිට පවත්වාගෙන යනු ලබන නමුත් ඒ වෙනුවෙන් කුලී මුදලක් මෙතෙක් අයකර නොතිබුණි.

(ආ) වැලිමඩ ප්‍රාදේශීය සභාවට නව ගොඩනැගිල්ලක් ඉදිකර ගැනීම සඳහා ප්‍රමාණවත් තරම් අරමුදල් හා සුදුසු ඉඩම් තිබියදී වර්තමානයේ වර්ෂයකට රු.1,164,000 ක කුළියක් ගෙවීමේ පදනම මත කුලී ගොඩනැගිල්ලකට සභාව ගෙන ගොස් තිබුණි.

3.3 **හඳුනාගත් පාඩු**

-------------------

සභාවට අයත් බොරලන්ද නිල නිවසේ විදුලිය විසන්ධි කිරීමෙන් පසු නැවත විදුලිය සන්ධි කිරීම සඳහා රු. 17,996 ක් ගෙවා තිබුණි.

3.4 **වත්කම් කළමනාකරණය**

---------------------------

3.4.1 **නඩත්තු හා අළුත්වැඩියා සිදු නොකිරීම**

------------------------------------------

(අ) දීර්ඝ කාලයක් අලුත්වැඩියා හා නිසි නඩත්තුවක් නොකිරීම හේතුවෙන් තැන්නේ කුඹුර උප කාර්යාලයේ ඇති ගබඩාව, වැසිකිලි හා අනෙකුත් ගොඩනැගිලි අබලන් තත්වයට පත්ව තිබුණි.

(ආ) කැප්පෙටිපොල උප කාර්යාලයේ පවත්වාගෙන යනු ලබන ඉසුරු පෙර පාසල හා දිවා සුරැකුම් මධ්‍යස්ථාන ගොඩනැගිලිවල දොරවල් හා ජනෙල් කිහිපයක් අබලන් තත්වයට පත්ව තිබීම පෙර පාසලේ ඉගෙනුම ලබන දරුවන්ගේ ආරක්ෂාවට ගැටළුවක් වී තිබුණි.

(ඇ) තැන්නේකුඹුර උප කාර්යාලයේ අනාරක්ෂිත ගොඩනැගිල්ලක් ගබඩාවක් ලෙස භාවිතා කරන අතර, 2017 දෙසැම්බර් 31 වන විටත් වටිනාකම වූ රු.257,015 වූ යකඩ බට 260ක් පමණ එහි ගබඩා කොට තිබුණි.

3.4.2 **නිෂ්කාර්ය වත්කම්**

--------------------

වටිනාකම රු.14,770,868 වූ අත් ට්‍රැක්ටර් 04ක්, ට්‍රැක්ටර් ට්‍රේලර් 02 ක් මෝටර් ග්‍රේඩරයක්, කම්පැක්ටරයක් හා ගිනිනිවන රථයක් කාර්යාල පරිශ්‍රයේ හා කැප්පෙටිපොල උප කාර්යාලයේ දීර්ඝ කාලයක් සිට නිශ්කාර්යව ගාල්කර තිබුණි.

3.5 **ප්‍රසම්පාදන**

------------

3.5.1 **ප්‍රසම්පාදන සැලැස්ම**

----------------------

සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

4. **යහපාලනය හා ගිණුම් කටයුතු භාවය**

----------------------------------------

4.1 **අයවැය පාලනය**

-------------------

සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ආදායම් හා වියදම් සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

4.2 **අභ්‍යන්තර විගණනය**

------------------------

2017 වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාව සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

5. **පද්ධති හා පාලන**

--------------------

විගණනයේදී නිරික්ෂණය වු අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර,පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | i | පුස්තකාල පොත් නිවැරදිව ගිණුම්ගත කර නොතිබීම. |
| | | ii | වර්ෂ අවසාන තොග හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබීම. |
| (ආ) | ආදායම් පරිපාලනය | i | ඉකුත් වර්ෂයන්ට හිඟ කුලී අයකර ගැනීමට කටයුතු කර නොතිබීම. |
| (ඇ) | ණය ගැතියෝ සහ ණයහිමියෝ | i | ණයගැති හා ණයහිමි ශේෂ නිරවුල් කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබීම. |
| | | ii | ණයගැති ශේෂ සනාථ කිරීම් ලබාගැනීමට කටයුතු කර නොතිබීම. |
| (ඈ) | ස්ථාවර වත්කම් | i | සමහර ස්ථාවර වත්කම් තක්සේරු කර නොතිබීම. |
| | | ii | සභා භූමිය තුළ අනාරක්ෂිතව යන්ත්‍ර හා උපකරණ ගාල්කර තිබීම. |